## ගොවිජන සංවර්ධන අරමුදල

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ගොවිජන සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ). සමාලෝචිත වර්ෂයේ දී මිලදී ගන්නා ලද රු.4,870,082 ක් වටිනා පරිගණක මෘදුකාංග පද්ධතිය වර්ෂයේ ලාභයට ලියාහැර තිබුණි.

(ආ). ට්‍රැක්ටර් හා වතුර පොම්ප වෙනුවෙන් අයකරගන්නා ලද වාරික මුදල්, මුදල් පදනම මත තැන්පත් ගිණුමට බැර කර තිබුණු අතර ලැබිය යුතු වාරික මුදල් පිළිබඳව ගිණුම්ගත කිරීමක් හෝ සටහනක් මගින් හෙළිදරව් කිරීමක් කර නොතිබුණි.

#### 1.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ). සමාලෝචිත වර්ෂය තුළ දී "ජපාන යෙන්" ආධාර වැඩසටහන යටතේ බෙදා දුන් ට්‍රැක්ටර් සඳහා අයකළ වාරික මුදල රු.56,376,207 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණත්

සංවර්ධන අංශයේ වාර්තා අනුව එය රු.52,179,498 ක් වූයෙන් රු.4,196,709 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ). පොදු තැන්පත් ගිණුමේ ශේෂය සහ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහනේ දැක්වෙන ශේෂය අතර රු.651,797 ක වෙනසක් වර්ෂ 04 කට වැඩි කාලයක සිටම පැවතුනත් එය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිවැරදි කර නොතිබුණි.

### 1.2.3 ලැබියයුතු සහ ගෙවියයුතු ගිණුම්

නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ). "ජපාන යෙන්" ආධාර යටතේ ප්‍රදාන වශයෙන් ලැබෙන කෘෂි උපකරණ, වාරික වශයෙන් ගෙවීමේ පදනමට ගොවි කමිටු හා ගොවි සමිති වෙත බෙදාදීමේ දී ප්‍රදානයෙන් 50% ක ප්‍රමාණයක් ප්‍රතිපාර්ශවීය අරමුදල් ගිණුමකට බැර කළ යුතු විය. මෙසේ බෙදාදී තිබුණු ට්‍රැක්ටර්, ඉසින යන්ත්‍ර හා ජල පොම්ප වෙනුවෙන් ගොවි කමිටු හා ගොවි සමිති වලින් අය කළ රු.210,878,908 ක මුදලක් ප්‍රතිපාර්ශවීය අරමුදලට බැර කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යවනු වෙනුවට 2011 දෙසැම්බර් 31 දක්වාම අරමුදලේ තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබුණි.

(ආ). ඉහත වැඩසටහන යටතේ එක් එක් වර්ෂවල බෙදාදුන් ට්‍රැක්ටර් සඳහා වාරික අයකර ගැනීම ඉතා මන්දගාමී තත්ත්වයක පැවති අතර 2011 දෙසැම්බර් 31 දිනට හිඟ වාරික මුදල රු.472,131,445 ක් විය. විස්තර පහත දැක්වේ.

| ට්‍රැක්ටර් වර්ගය | ට්‍රැක්ටර් බෙදාදුන් වර්ෂය | ට්‍රැක්ටර් ගණන | අයවිය යුතු මුදල<br>රු. | අයකළ මුළු මුදල<br>රු. | හිඟ මුදල<br>රු. |
|---|---|---|---|---|---|
| රෝද 02 ට්‍රැක්ටර් | 1992 - 2008 | 1596 | 225,204,050 | 138,014,933 | 87,189,117 |
| රෝද 02 ට්‍රැක්ටර් | 2010 | 1004 | 251,000,000 | 56,426,804 | 194,573,196 |
| රෝද 04 ට්‍රැක්ටර් | 1986 -2001 | 591 | 214,081,210 | 23,712,078 | 190,369,132 |
| එකතුව | | 3191 | 690,285,260 | 218,153,815 | 472,131,445 |

(ඇ). 1995 සහ 1996 වර්ෂවලදී අරමුදල විසින් බෙදාදෙන ලද රෝද 02 ට්‍රැක්ටර් ට්‍රේලර් සහ රෝද 04 ටැක්ටර් ට්‍රේලර් සඳහා 2011 දෙසැම්බර් 31 දිනට හිඟ වාරික මුදල පිළිවෙලින්

රු.1,498,566 ක් සහ රු.4,749,500 ක් වුවත් සමාලෝචිත වර්ෂයේදී කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණි.

(ඇ). 2006 වර්ෂයට පෙර හඳුනාගත් තොග ඌනතාවය රු.450,000 ක් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු නොකර දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික්ක 23 කට අදාලව අක්කර බදු වශයෙන් රු.9,130,716 ක් ලැබී තිබූ නමුත් මෙම දිස්ත්‍රික්ක වලට අදාල වාර්ෂික ඉලක්කගත අක්කර බදු සහ ලැබූ සහ ලැබිය යුතු අක්කර බදු ප්‍රමාණයන් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් අක්කර බදු ලෙස ඒ ඒ ගොවිජන සේවා මධ්‍යස්ථාන විසින් අයකරගෙන ඇති මුළු මුදලෙන් 20% ක් ගොවිජන සංවර්ධන අරමුදලට එවා තිබුණිද යන්න විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

**1.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

අරමුදල විසින් විවිධ කාර්යයන් සඳහා ලබාදී තිබුණු රු.2,432,892 ක් වටිනා අත්තිකාරම් පියවා නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් මු.රෙ. 371 (5) ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,690,383 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.3,575,521 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.1,885,138 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. අක්කර බදු ආදායම හා කුවිතාන්සි පොත් අලෙවි ආදායම රු.2,490,147 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**
---------------------------

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**
-----------------------------------

නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ). සමාලෝචිත වර්ෂයේදී ගර්හිත ට්‍රැක්ටර් 126 ක රු.13,613,500 කට විකුණා එම මුදල් ඒකාබද්ධ අරමුදලට බැරකර තිබුණි. එම ට්‍රැක්ටර් භාරදී තිබූ ගොවිජන සේවා කමිටු වලින් ඒට අදාල වාරික මුදල් කාර්යක්ෂමව අයකර ගැනීමේ වැඩපිළිවෙලක් නොවීම නිසා එම ට්‍රැක්ටර් සඳහා හිඟ වාරික වශයෙන් රු.19,039,513 ක මුදලක් තවදුරටත් අයවිය යුතුව තිබුණි.

(ආ). "ජපාන ආධාර 2008" ව්‍යාපෘතිය යටතේ 2010 වර්ෂයේ බෙදාහරින ලද වතුර පොම්ප 390 ක් සඳහා රු.11,700,000 ක් 2012 වර්ෂය වන විටදී වාරික ලෙස අයකල යුතු වූ අතර එහි මූලික ගෙවීම් ලෙස රු.3,120,000 ක් අයවිය යුතු වුවත් 2011 දෙසැම්බර් 31 දිනට මූලික ගෙවීම හා වාරික වශයෙන් අයකර තිබුණු මුදල රු.3,372,883 ක් විය.

(ඇ). අරමුදල විසින් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් කාර්යාලවලට ලබාදී තිබුණු රු.517,500 ක අත්තිකාරම් මුදල් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් තොරව ආපසු එවා තිබුණු අතර දිස්ත්‍රික් කාර්යාල 03 ක් අදාල ව්‍යාපෘති සඳහා ලබාදුන් රු.65,500 ක චෙක්පත් භාරනොගෙනම ආපසු එවා තිබුණි.

3.2 **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**
-----------------------------------------

නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ). ගම්බද වාරිමාර්ග යටතේ ජල ප්‍රමිතිය පරීක්ෂා කිරීමේ වැඩසටහන සඳහා සමාලෝචිත වර්ෂයේදී ගංගා ද්‍රෝණි සිතියම් ඇල්බමයෙහි පිටපත් 500 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් රු.543,915 ක් වැයකර තිබුණු අතර විගණිත දිනය වූ 2012 අගෝස්තු 31 දින දක්වාම ඒවා බෙදාහැරීමට කටයුතු කර නොතිබුණි.

(ආ). ගම්බද වාරිමාර්ග දත්ත අත්පොත් මුද්‍රණ වැය යටතේ පොත් 10,000 ක් මුද්‍රණය සඳහා සිතියම් දෙකක් වෙනුවෙන් 2010 වර්ෂයේදී රු.1,444,500 ක් හා පොත් මුද්‍රණය සඳහා

2011 වර්ෂයේදී රු.1,512,000 ක් වශයෙන් රු.2,956,500 ක් වැයකර තිබුණද 2012 අගෝස්තු 31 දින දක්වාම බෙදාහැරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ). ඉකුත් වර්ෂවලදී මුද්‍රණය කරන ලද ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශ දැක්වෙන සිතියම් 1,000 කින් 594 ක් අලෙවි කර තිබුණු අතර ඉතිරිය 406 ක් විය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය
------------------------------------------

4.1 අයවැය ලේඛනමය පාලනය
-----------------------------

නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ). 2011 වර්ෂයේ අයවැය ලේඛනයේ සංවර්ධන කාර්යයන් 04 ක් සඳහා වෙන්කළ රු.6,275,000 ක ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ). අයවැයගත සහ තත්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් වූයෙන්, අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලනයන්
--------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කොමසාරිස් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ). අක්කර බදු අයකර ගැනීම.

(ආ). තැන්පතු ගිණුම් නිරවුල් කිරීම.

(ඇ). ණය අයකර ගැනීම.

(ඈ). වත්කම් උපයෝජනය.

(ඉ). අත්තිකාරම් ලබාදීම.